ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහජන ආරක්ෂක අමාත්‍යාංශය, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙලකිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත්කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය නොවන වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.226,373,135ක් වැයකර තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි (SA-82) එම වටිනාකම රු.173,856,707ක් ලෙස රු.52,516,428ක් අඩුවෙන් දක්වා තිබුණි.	(i), (ii) සහ (iii) පෙර වර්ෂයන්හි අවසාන මූල්‍ය නොවන වත්කම් ශේෂය විගණිත වර්ෂයේ ආරම්භක ශේෂය සමග සැසඳීමේ දී ශේෂ සමාන නොවීමේ ගැටලුව අමාත්‍යාංශයේ ගිණුම්කරණ දෝෂයක් නොවන අතර, එය CIGAS ගිණුම්කරණ පද්ධතියේ පවතින තාක්ෂණික ගැටලුවක් හේතුවෙන් ඇති වේ. මේ පිළිබඳ නිරන්තරයෙන් භාණ්ඩාගාරයේ ජාතික ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර නිවැරදිකර ගැනීමට උත්සාහ කළ අතර, නැවත නැවතත් එම දෝෂය ඇති වේ. මේ පිළිබඳව අංක PS/03/FIN/02/84/2025 හා 2025.03.24 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත්කර ඇති අතර, වාචිකව දැනුවත් කිරීමක් ද සිදුකර ඇත. අවශ්‍ය නිවැරදි කිරීම් කර ඇති බව දන්වා ඇතත්, අගෝස්තු මස භාණ්ඩාගාර මුද්‍රිතයන් මගින් ද තහවුරු නොවේ. නිවැරදි කිරීම් භාණ්ඩාගාර මුද්‍රිත මගින් නිරූපණය නොවන බව ද භාණ්ඩාගාරය දැනුවත්කර ඇත.	ආරම්භක ශේෂවල වෙනස්වීමේ තාක්‍ෂණික ගැටලු නිවැරදිකර ගිණුම්වල ශේෂයන් නිවැරදිව පිළියෙලකර ඉදිරිපත් කළ යුතුවීම.
(ii)	2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා ඉදිකිරීම්, කෙරීගෙන යන වැඩශේෂය රු.732,237,046ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.762,739,186ක් ලෙස දැක්වීම හේතුවෙන් SA - 82හි ආරම්භක ශේෂය රු.30,502,140ක් වැඩියෙන් දක්වා තිබුණි.		
(iii)	2023 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ රු.852,430,841ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.715,330,840ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82හි ආරම්භක ශේෂය රු.137,100,001ක් අඩුවෙන් දක්වා තිබුණි.		
(iv)	2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ ශේෂය රු.2,888,360,739ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.2,802,095,873ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82හි ආරම්භක ශේෂය රු.86,264,866ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වූ මුද්‍රණ දෝෂය නිවැරදිකර, නිවැරදි මූල්‍ය නොවන වත්කම් ශේෂයන් 2024 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත.	මුද්‍රණ දෝෂ ඇති නොවන ලෙස ශේෂ සටහන්කළ යුතු බව.

(v)	සමාලෝචිත වර්ෂය තුළ මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් වාහන 09ක් අනතුරට ලක්වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් i හා ii තුළ ඉදිරිපත්කර නොතිබුණි.	2024 වර්ෂය තුළ දී අලාභ හානි ලේඛනය යාවත්කාලීන කිරීම මගහැරී තිබූ අතර, මේ වන විට එම තොරතුරු ඇතුළත්කර යාවත්කාලීන කිරීමට කටයුතුකර ඇත.	අනතුරු සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කළ යුතු බව.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**හානි පිළිබඳ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි.	මු.රෙ. 110(1) ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල හානි හා වෙනත් කටයුතු වලින් ඇති වන හානි පිළිබඳව වාර්තා කිරීම සඳහා වෙන වෙනම පොත් පවත්වාගත යුතු වුව ද, අත්තිකාරම් ගිණුම්වල මේ වන තෙක් හානියක් වාර්තා වී නොමැති බැවින්, ඒ සඳහා පොතක් පවත්වාගෙන ගොස් නොමැත. කෙසේ වුව ද, ඉදිරි වර්ෂය සඳහා පොතක් ආරම්භකර පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි 110හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුවීම.
(ii)	**බැරකම් පිළිබඳ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් පිළිබඳ වාර්තාවක් CIGAS පරිගණක පද්ධතිය මගින් ලබාදෙන බැවින්, ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. නමුත් විගණන විමසුමේ දක්වා ඇති පරිදි ඉදිරියේ දී බැරකම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතුකර ඇත.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන්කළ යුතුවීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

	ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i)	1.6.1	අමාත්‍යාංශයට අයත් වාහන 4ක් අවස්ථා පහක දී අනතුරට ලක්වී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම I හා ඇමුණුම II තුළ ඉදිරිපත්කර නොතිබුණි.	1.6.1 (අ)(v)
(ii)	1.6.2(අ) (i)	ගොඩනැගිලි හා ඉදිකිරීම් කෙරීගෙන යන වැඩ පෙර වර්ෂ අවසාන ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වශයෙන් ගැනීමට කටයුතු කළ යුතුවීම.	1.6.1 (අ)(ii)
(iii)	1.6.2 (අ) (ii)	අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ පෙර වර්ෂ අවසාන ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වශයෙන් ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (අ)(iv)
(iv)	1.6.2 (අ) (iv)	වැය ලෙජර අනුව සමාලෝචිත වර්ෂය තුළ දී වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.237,371,259ක් වැයකර තිබුණ ද, මූල්‍ය වත්කම් ප්‍රකාශයෙහි (ACA-6) මිලදීගැනීම් ලෙස රු.77,732,482ක් දක්වා තිබීම හේතුවෙන්, වර්ෂය තුළ දී මිලදීගැනීම රු.59,639,777ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අඩුවෙන් දක්වා තිබුණි.	1.6.1 (අ)(i)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 189-1-01-1202-009 (ඉන්ධන වෙනත්) හා 189-1-01-1203-002 (නිලඇඳුම්) දරන වැයවිෂයන් සඳහා රු.100,000ක් බැගින් වෙන්කරන ලද රු.200,000ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණු අතර, ඊට හේතු	අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලය සඳහා මෙම වැයවිෂය වෙන්කර ඇති අතර, අත්‍යාවශ්‍ය හදිසි වියදම් අපේක්ෂාවෙන් මෙම වැය විෂයන්ට අදාළ ඇස්තමේන්තු ඉතා අවම වටිනාකමක් ඇතුළත්කර	අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙලකළ යුතුවීම.

	වශයෙන් පිළිවෙලින්, වෙනත් අවශ්‍යතා සඳහා ඉන්ධන භාවිතා කිරීම වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් නොවීම හා රජයේ නිලධාරීන් අමාත්‍ය කාර්යමණ්ඩලයට පත්නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම යන්න දක්වා තිබුණි.	සකස්කළ ද, අපේක්ෂාකළ පරිදි වියදම් ඇති නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	
(ආ)	ඇස්තමේන්තු සකස්කිරීමේ දුර්වලතාවය හේතුවෙන් වැය විෂයන් 21ක් සඳහා මූලික ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 2600ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව වැටුප් වැඩිවීම හේතුවෙන් වැටුප් හා දීමනා වැය විෂයන් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන ලැබීම් හා මූ.රෙ. 66 යටතේ මාරුකිරීම් අනිවාර්යෙන් සිදුකළ යුතු අතර, අනෙකුත් වැය විෂයන්ගේ රජයේ හා අමාත්‍යාංශ මට්ටමින් වසර තුළ සිදුවන අත්‍යාවශ්‍ය වෙනස්වීම්වල දී සමස්ත ඇස්තමේන්තුව තුළ විවිධ ප්‍රතිපාදන මාරුකර ගැනීම සඳහා විසර්ජන පනතින් හා මුදල් රෙගුලාසි මගින් බලය ලබා දී ඇති අතර, ඒ අනුව අදාළ මාරුකිරීම් හේතුවෙන් මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර වෙනස්කම් ඇත.	අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙලකළ යුතුවීම.
(ඇ)	වැය විෂයන් 16ක් සඳහා සලසා තිබූ එකතුව රු.3,315,898,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදිතයෙන් රු.2,160,749,118ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 36 සිට සියයට 90 දක්වා පරාසයක්ගෙන තිබුණි.	රු.2,160,749,118ක් වූ ප්‍රතිපාදන ඉතිරියෙන් රු.1,943,373,939ක්ම විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතියට අදාළව වෙන්කර තිබූ ප්‍රතිපාදන වන අතර, විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතියට අදාළ ඇතැම් ප්‍රසම්පාදනයන් අපේක්ෂාකළ පරිදි අවසන්කර ගැනීමට නොහැකිවීම, අනුමත පුරප්පාඩු සඳහා නිලධාරීන් අපේක්ෂා කළ පරිදි බඳවාගැනීමට නොහැකි වීම සහ අපේක්ෂාකළ පරිදි පුහුණු වැඩසටහන් පවත්වාගැනීමට නොහැකිවීම යන හේතුන් නිසා එම ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙලකළ යුතුවීම.

(ඇ)	වැයවිෂයන් 7ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකරන ලද රු.125,900,000ක ප්‍රතිපාදිතයෙන් රු.39,729,790ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 මාරු කිරීම්වලට ප්‍රතිශතයක් ලෙස සියයට 13 සිට සියයට 150ක පරාසයක්ගෙන තිබුණි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව ප්‍රසම්පාදනයන් ආරම්භ කළ නොහැකි බැවින් මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන සලසාගෙන අදාළ ප්‍රසම්පාදනයන් ආරම්භකළ ද, අපේක්ෂාකළ පරිදි අදාළ ව්‍යාපෘති අවසන්කර ගැනීමට නොහැකිවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් පෙන්නුම් කරයි.	ඇස්තමේන්තු නිවැරදිව සකස්කර ප්‍රතිපාදන සලසාගත යුතු බව.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 447(i) ප්‍රකාරව විසර්ජන වැයලෙජරයක් පවත්වාගත යුතු අතර, ඉතිරිව ඇති නිවැරදි මුදල් ප්‍රමාණය දැනගැනීමට හැකිවන ලෙස ගිණුමේ වියදම් කළ මුදල් ප්‍රමාණය පමණක් නොව බැඳී ඇති බැරකම් ද දැක්විය යුතු වුව ද, අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පොදු-138 අනුව වැයලෙජරයන්හී බැඳී තිබූ සියලු බැරකම් දක්වා නොතිබුණි	මේ වන විට බැරකම් ලේඛනයක් පවත්වාගැනීමට කටයුතුකර ඇත.	මු.රෙ. 447(1) ප්‍රකාරව ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය දැනගැනීමට හැකිවන පරිදි වැයලෙජරයක් පවත්වාගත යුතු බව.
(ආ)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා මුදල් රෙගුලාසි 94(2) සහ 94(3) ප්‍රකාරව එළැඹෙන ලද බැඳීම් හා බැරකම් වෙන වෙනම හෙළිදරව්කළ යුතු වුවත්, වැය විෂයන් 11කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එළැඹී තිබුණු බැඳීම් සහ බැරකම් රු.2,827,638ක් බැරකම් හා බැඳීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	මු.රෙ. 94(2) ප්‍රකාරව ඊළඟ මුදල් වර්ෂය තුළ බේරුම් කිරීමට අපේක්ෂාවෙන් බැරකමකට බැඳී ඇති අතර, පවත්නා මුදල් වර්ෂයේ ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත සිගාස් යෙදුමේ බැරකම් ප්‍රකාශනයට ඇතුළත්කර නොමැත.	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා මු.රෙ. 94(2) සහ 94(3) ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ඇ)	මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වුව ද, ප්‍රතිපාදන ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයන් 13ක් යටතේ රු.2,086,431ක් බැඳීම් හා බැරකම් ලෙස එළැඹ තිබුණි.	මු.රෙ. 94(2) ප්‍රකාරව පුනරාවර්තන ස්වභාවයේ වියදම් සඳහා පවත්නා මුදල් වර්ෂයේ ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන දැක්වෙන විට සහ ඊළඟ මුදල් වර්ෂයේ දී එබඳු වියදම් අපේක්ෂා කෙරේ නම් මු.රෙ.94(1) විධිවිධාන නොතකා දෙපාර්තමේන්තුවකට ඊළඟ මුදල් වර්ෂය තුළ බේරුම් කිරීමට සිදුවන බැරකමකට බැඳිය හැකි ය.	මු.රෙ. 94(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු ය.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවටත්, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳ කලින් කළට සමාලෝචනයක් සිදුකරන බවටත්, ඒ අනුව පාලන පද්ධතියේ වෙනස්කම් සිදුකරනු ලබන බවටත්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-පී මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වී විගණනයට ඉදිරිපත්කර ඇති බව කාරුණිකව දන්වමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	(i) මු.රෙ.104 (3),(4)	-	නැතිවීම් හානිවීම් සම්බන්ධ මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක	104(3) සහ 104(4) වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොමැති අතර,	මු.රෙ. 104 (3), 104(4) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා පූර්ණ වාර්තා

			වාර්තා සහ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත්කර එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තාවල පිටපත් ඉදිරිපත්කර නොතිබුණි.	ඉදිරියේ දී එම වාර්තා විගණකාධිපති වෙත එවීම සඳහා සටහන්කර ගතිමි.	නියමිත පරිදි විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.
(ii)	මු.රෙ.156 (ආ)	-	රජය විසින් තමා වෙත නිකුත් කරන ලද හෝ තමා භාරයේ තබාගැනීමට දෙන ලද්දා වූ දේපළක් සුරක්ෂිතව තබාගැනීම, නිසිපරිදි පාවිච්චි කිරීම සම්බන්ධ සියලුම අවස්ථාවල වගකිව යුතු වේ. එසේ වුව ද, වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු අවශ්‍ය නොවන බව පොලීසිය වෙත රියදුරු විසින් පැමිණිලිකර තිබුණි.	අංක KX – 5893 හා KX – 5897 දරන රථයන් සම්බන්ධයෙන් එම රියදුරන් පොලිස් පැමිණිල්ලේ එලෙස සටහන්කර තිබුණ ද, එම රියඅනතුරු සම්බන්ධයෙන් වූ කාර්යාලයීය පරීක්ෂණ තවදුරටත් සිදුකරමින් පවතී.	මු.රෙ. 156(ආ) ප්‍රකාරව රජය විසින් තමා වෙත නිකුත් කරන ලද හෝ තමා භාරයේ තබාගැනීමට දෙන ලද්දා වූ දේපළක් සුරක්ෂිතව තබාගත යුතු බව.
(iii)	මුදල් රෙගුලාසි 1647(ආ)	-	අමාත්‍යාංශයේ වාහන ඒවායේ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වන අතර, එක් නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනය භාරදෙනු ලැබූ වහාම ද, එසේම වාහනයේ රියදුරන් පිළිබඳ වෙනසක් සිදු වූ වහාම ද එවැනි	වාහන උපකරණ සමීක්ෂණය සඳහා තාක්ෂණික දැනුම සහිත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණු බැවින්, වාහන උපකරණ සමීක්ෂණය සිදුනොකළ බවත්, ඉදිරි භාණ්ඩ සමීක්ෂණයන්වල දී මේ පිළිබඳ	මු.රෙ. 1647(ආ) ප්‍රකාරව අමාත්‍යාංශයට අයත් වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු බව.

			සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, අමාත්‍යාංශයට අයත් වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	අවධානය යොමුකිරීමට සටහන්කර ගතිමි.	
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.	ඉන්ධන පරීක්ෂාව සිදුකොට එම වාර්තාව යාන්ත්‍රික ඉංජිනේරුවරයා ගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත්කළ ද, එකම වර්ගයේ වාහනවල ඉන්ධන දහනය විවිධ අගයන් පෙන්වන බැවින්, නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු බව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් දන්වන ලද බැවින් යාන්ත්‍රික ඉංජිනේරුවරයා ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කොට නැවත ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමින් පවතී.	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකිරීමට කටයුතු කළ යුතු බව.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය				

(i) 5.4.8 වගන්තිය	24,800,000	කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝණය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්‍ෂා කිරීම සඳහා ඇස්තමේන්තු කොන්ත්‍රාත් මුදලින් සියයට 5කට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක් ලෙස ලබාගත යුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා E.W. Information system (PVT)Ltd ආයතනයට රු.24,800,000ක මුදලක් ගෙවා තිබුණු නමුත් ඊට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.	වාර්ෂික නඩත්තු සේවා ගිවිසුමක් යටතේ පවත්වාගෙන යන බැවින්, ඉදිකිරීම් වැඩ සඳහා ගත යුතු කාර්යසාධන සුරක්ෂණය මෙහිදී අවශ්‍ය නොවන්නේ යැයි අදහස් කළෙමි. කෙසේ නමුත්, කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණේ නම් ප්‍රසම්පාදන අස්ථිත්වයේ ආරක්ෂාව සහතික වන බව පිළිගන්නා අතර, මින් ඉදිරියට ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනිමි.	කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹෙන අවස්ථාවේ දී කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු බව.
(ii) 8.7.1 වගන්තිය	-	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත්කළ යුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා වූ ප්‍රසම්පාදනයේ දී එසේ සිදුකර නොතිබුණි.	මෙය නව ප්‍රසම්පාදනයක් නොවන නිසා ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත්කිරීම අවශ්‍ය නොවන්නේ යැයි හැඟීගිය හෙයින් එවැනි ලිපියක් නිකුත්නොකළ අතර, ඉදිරියේ දී සිදුකරනු ලබන මෘදුකාංග ආශ්‍රිත ප්‍රසම්පාදනයන්හි දී ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත්කිරීමට පියවර ගනිමි.	8.7.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත්කළ යුතු බව.
(iii) 8.9.3 වගන්තිය	-	අදාළ කාර්යයන් ලබාදුන් කොන්ත්‍රාත්කරු සමග විධිමත්	එකඟ වේ. මෙය නව ප්‍රසම්පාදනයක් නොවන නිසාත්,	8.9.3 වගන්තිය අනුව අදාළ කාර්යයන් ලබාදුන් කොන්ත්‍රාත්කරු

ගිවිසුමකට එළැඹිය යුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹ නොතිබුණි.	පවතින මෘදුකාංග පද්ධතියේ වැඩිදියුණු කිරීමක් නිසාත් ගිවිසුමකට එළැඹීම සිදුනොවිණි. තව ද, වාර්ෂික නඩත්තු ගිවිසුම මගින් සමස්ත මෘදුකාංග පද්ධතියම ආවරණයවීම ද ඊට හේතු විය.	සමග විධිමත් ගිවිසුමකට එළැඹිය යුතු බව.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මු.රෙ. 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ම ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි	ඉකුත් වූ තැන්පතු ලැයිස්තුවක් පිළියෙලකර නොතිබුණු අතර, ඉදිරියේදී මු.රෙ.571 (1) පරිදි අර්ධ වාර්ෂික ඉකුත් තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.	මු.රෙ. 571(1) පරිදි තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කළ යුතු බව.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා මාලි රාජ්‍යය තුළ විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික ප්‍රවාහන බලඇණියක් ස්ථාපිත කිරීම පිණිස හා ඊට අදාළ පුහුණුවීම් ඇතුළු අවශ්‍ය අවිආයුධ හා උපකරණ මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. මිලියන 1,872.8ක රජයේ මුදල් වැය කර තිබුණි. අනතුරුව 2024 වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතිය කඩිනමින්	2016 දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අයවැය තුළට ඇතුළත් කිරීම මගින් අවස්ථා කිහිපයක දී ලබාදෙන ලදී. 2019 සිට 2023 දක්වා කාලය තුළ රට තුළ පැතිරුණු කොරෝනා වසංගතය හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට සැලකිය යුතු බලපෑමක් එල්ලකර ඇත. කෙසේ නමුත් මේ වන විට ව්‍යාපෘතිය අවසන් අදියර දක්වා පැමිණ ඇත. වර්ෂ 2024/25 කාලය තුළ කිසිදු ආකාරයේ සක්‍රීය මෙහෙයුමක් එක්සත් ජාතීන්ගේ	අපේක්ෂිත අරමුණු නොපමාව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවීම.

	ක්‍රියාත්මක කිරීම පිණිස නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. 2024 සැප්තැම්බර් 06 දිනැතිව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන අනුව එදින වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 2000කට ආසන්න මුදලක් දරා ඇති බව තහවුරු වන නමුත් එම බලඇණි මේ දක්වා යැවීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය තුළින් නිසි ප්‍රතිලාභයක් රජයට අත් වී නොමැති බවට නිරීක්ෂණය විය.	සාමසාධක මෙහෙයුම් කාර්යාලය මගින් ආරම්භකර නොමැති බව පැහැදිලි වේ. කෙසේ නමුත් විශේෂ කාර්යබලකායේ සාමසාධක බලඇණිය මෙහි දක්වා ඇති Formed Police Unit යන කොටසට අයත් වන අතර, එම කොටසේ දැනට චීනය හා නේපාලය යන රටවල් ඕනෑම මොහොතක මෙහෙයුම් සඳහා සහභාගී විය හැකි මට්ටමේ (RDL) ස්ථානගතකර ඇත. එයට පසු මට්ටම වන Level III යටතේ රටවල් 04ක් ඇති අතර, ඉන් පළමුවන ස්ථානය ලබාගෙන ඇත්තේ විශේෂ කාර්ය බලකායයි. එමෙන්ම Formed Police Unit යටතේ විශේෂ කාර්ය බලකායට පසුපසින් රටවල් 30ක් මෙම පොරොත්තු ලේඛනයේ පවතී. ඒ අනුව මෙම අනෙකුත් රටවල් අභිබවා විශාල අර්ථිකමය අභියෝග හමුවේ විශේෂ කාර්ය බලකාය විසින් මෙම ව්‍යාපෘතියේ අවසන් අදියර දක්වා පැමිණ ඇත.	
(ආ)	විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරීගේ ලිපිය මගින් ලබා දී ඇති තොරතුරු අනුව සාමසාධක පොලිස් බලමුළුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා පිටත් කිරීමට අවශ්‍ය Rapid Deployment Level – (RDL) මට්ටම සම්පූර්ණකර නොතිබුණු අතර, ඒ සඳහා Assessment of operational Capability (AOC) හා Verification Visit (VV) පරීක්‍ෂණ අවසන්කළ යුතු වුවත්, මෙතෙක් එම පරීක්‍ෂණ අවසන්කර නොතිබුණි.	විශේෂ කාර්යබලකා සාමසාධක පොලිස් බලමුළුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා පිටත් කිරීමට අවශ්‍ය UN Peacekeeping Capability Readiness System (PCRS)හි මීළඟ මට්ටම වන Rapid Deployment Level (RDL) වෙත උසස් කිරීමට සිදුකළ යුතුව ඇති මීළඟ පරීක්ෂණය වන Assessment of Operational Capability (AOC) පරීක්ෂණ කටයුතු කඩිනම්කර ගැනීමට අවශ්‍ය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	අපේක්ෂිත අරමුණු නොපමාව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවීම.
(ඇ)	ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගන්නා ලද රු.1,264,019,078ක් වටිනා වාහන 53ක් 2018 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා කඳවුරු 17ක ගාල්කර තිබුණු අතර, එම වාහන නඩත්තු කටයුතු සඳහා 2024 දෙසැම්බර් 31 දක්වා දරා ඇති වියදම රු.3,018,272ක් විය.	එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2017 සහ 2020 වර්ෂවල නිකුත් කරන ලද Statement of Unit Requirement (SUR) ලේඛනවල සඳහන් පරිදි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරීක්ෂණ කණ්ඩායම් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත Assessment of Operational	ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගන්නා ලද වත්කම් අපේකෂිත අරමුණු සඳහා යෙදවිය යුතු බව.

		Capability (AOC) පරීක්ෂණය වෙත මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වාහන ඉදිරිපත් කළ යුතුව ඇති බැවින්, වාහන සාමසාධක රාජකාරී සඳහා යොමුකරන තෙක් වාහන නිසිලෙස නඩත්තුකර පවත්වාගෙන යා යුතු ය.	
(ඇ)	ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පුහුණු පාඨමාලා 28ක් පවත්වා ඇති අතර, ඒ සඳහා විශේෂ කාර්යය බලකායේ වැය ශීර්ෂය මගින් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත ආයතන මගින් අනුග්‍රහය දක්වා ඇතත්, දරන ලද වියදම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ආරම්භකර 2024 වර්ෂය වන විට දේශීය හා විදේශීය පාඨමාලා 28ක් පමණ නිලධාරින් විසින් හදාරා ඇත. ඉන් විශේෂ කාර්යබලකාය මගින් හදාරන ලද පාඨමාලාවන් සඳහා විශේෂ කාර්ය බලකා පුහුණු වැය ශීර්ෂයේ ප්‍රතිපාදන මගින් වියදම්කර ඇත. ඊට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත (IPPOS, UNITAR) ආයතන අනුග්‍රහය යටතේ පවත්වන පාඨමාලාවන් සඳහා නිලධාරින් යොමුකර ඇති අතර, ඒ සඳහා එම ආයතන විසින් පාඨමාලාවන් සඳහා සියළුම වියදම් දරා ඇති බැවින්, සාමසාධක පොලිස් බලමුළු ව්‍යාපෘතියට අදාළව නිලධාරින් හදාරන ලද පාඨමාලාවන් සඳහා දරන ලද වියදම් ගණනය කළ නොහැක.	පුහුණු පාඨමාලා සඳහා දරන ලද වියදම් පැහැදිලිව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කටයුතු කරනු ලබන ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන 05ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.1(ඇ) ප්‍රකාරව ලංසු කැඳවීම සඳහා දී ඇති කාලය, ලංසු පිළියෙල කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් විය යුතු වුවත්, සැපයුම්කරුවන් සඳහා ලංසු ඉදිරිපත්	2023.11.09 දින ලංසු ආරාධනය සඳහා දැන්වීම පළකර ලංසු භාර ගැනීමේ අවසාන දිනය ලෙස 2023.12.21 ප්‍රකාශකර තිබුණි. පසුව පූර්ව ලංසු රැස්වීමට පසු විභව ලංසුකරුවන්ගේ ඉල්ලීම සලකා බලා ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු භාරගැනීමේ අවසාන දිනය ලෙස පැවති 2024.01.16 දින සිට දින 26ක කාලයක් දීර්ඝ කරන ලදී. හිටපු පාලක ජනරාල් විසින් පවතින විදේශ ගමන් බලපත්‍ර තොගය සීමිත	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.1 (ඇ) ප්‍රකාරව ලංසු කටයුතු කිරීම සිදුකළ යුතු බව.

	කිරීමට ප්‍රමාණවත් සාධාරණ කාලයක් ලබා දී නොතිබුණි.	බවත්, කඩිනමින් ප්‍රසම්පාදනය සිදුකරන ලෙසත් කර ඇති ඉල්ලීම් සලකා බලා නැවත කාලය දීර්ඝ කිරීමක් සිදුකර නොමැත. ලංසු භාරදීමට දින 68ක කාලයක් ලබා දී තිබේ.	
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා, අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු ය. රටවල් අතර තොරතුරු හුවමාරුකර ගැනීමට හැකිවන පරිදි විද්‍යුත් ගමන් බලපත්‍ර හඳුන්වාදීමේදී PKI(Public Key Infrastructure) අත්‍යාවශ්‍යම ප්‍රධාන අංගයක් බව තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් නිරීක්‍ෂණයකර ඇති අතර, ඒ අනුව මෙම ප්‍රසම්පාදනයට අදාළ මුල් ලංසු ලේඛනයෙහි Volume 02, Section IV (2)(C) මගින් ලංසුකරු විසින් සේවායෝජක සමග PKI යටිතල පහසුකම් නිර්මාණය කළ යුතු අතර, මෙම කොන්ත්‍රාත්තුවේ කොටසක් ලෙස සේවායෝජකයන්ගේ වෙබ් අඩවියේ ඉල්ලා සිටින සියලුම සංරචක ස්ථාපනය හා පරීක්‍ෂා කිරීම සිදුකළ යුතු බව දන්වා තිබුණි. නමුත් 2023 දෙසැම්බර් 12 දිනැති අංක DIE/PRO/03/2022/20 ලිපිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතීත්වයෙන් යුතු කමිටු රැස්වීමකින් PKI යටිතල පහසුකම් සැපයීම වෙනමම ප්‍රසම්පාදනයක් ලෙස සිදුකිරීමට තීරණයකර තිබුණි. එම තීරණය මත උක්ත සංරචකය තාක්‍ෂණික පිරිවිතරයන් තුළින් ඉවත් කිරීමට තීරණයකර තිබුණි. ඒ අනුව අතිරේක 01 මගින් මුල් ලංසු ලියවිලිවල Volume 02 Section VI 2 (C) ඉවත්කර තිබුණි.	මුල් ලංසු ලේඛනයේ VI 2Cහි Public Key Infrastructure (PKI) පහසුකම් සැපයීම සිදුකළ යුතු බව දන්වා තිබුණ ද, අතිරේක 1 මගින් එම වගන්තිය ඉවත්කර ඇත. මෙම ප්‍රසම්පාදනය සඳහා එවකට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදේශකවරයෙකු පත්කර සිටින අතර, එම මහතා විසින් ලබා දී ඇති නිර්දේශ අනුව වෙළෙඳ ඒකාධිකාරීත්වයක් ඇතිවිය හැකි බැවින් PKI සැපයීම වෙනම ප්‍රසම්පාදනයක් ලෙස සිදුකිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව එකඟ වී ඉදිරි කටයුතු සිදු වී ඇත. 2023.12.12 දින පැවති රැස්වීමට තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් තිදෙනෙක් පමණක් සහභාගී වුවත්, එම තීරණයට තාක්ෂණික ඇගයීම් කමිටු සියලු සාමාජිකයන් එකඟ වී ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) ප්‍රකාරව කටයුතු කළ යුතු බව.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (SA-82) ආරම්භක ශේෂය සඳහා ගැළපීම් ලෙස රු.469,415,000 දක්වා තිබුණු අතර, ඒ තුළ කෙරීගෙන යන ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා වූ රු.22,014,287ක්, ප්‍රවාහන උපකරණ සඳහා වූ රු.137,100,000ක් සහ රු.86,955,366ක් වූ වෙනත් යන්ත්‍රෝපකරණ සහ උපකරණවලට අදාළ තහවුරු කිරීම් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.	පෙර වර්ෂයන්හි අවසාන මූල්‍ය නොවන වත්කම් ශේෂය විගණිත වර්ෂයේ ආරම්භක ශේෂය සමග සැසඳීමේ දී ශේෂ සමාන නොවීමේ ගැටලුව අමාත්‍යාංශයේ ගිණුම්කරණ දෝෂයක් නොවන අතර, එය CIGAS ගිණුම්කරණ පද්ධතියේ පවතින තාක්ෂණික ගැටලුවක් හේතුවෙන් ඇති වේ. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව හා වාචිකව දැනුවත්කර ඇත. අවශ්‍ය නිවැරදි කිරීම් කර ඇති බව දන්වා ඇතත්, අප්‍රේල් මස භාණ්ඩාගාර මුද්‍රිතයන් මගින් ද තහවුරු නොවේ.	තාක්‍ෂණික ගැටලු කඩිනමින් නිරාකරණයකර නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු බව.
(ආ)	විශේෂ කාර්යය බලකායට අයත් වාහන 8ක් අලුත්වැඩියාව සඳහා ගරාජ වෙත යොමුකර 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 සිට 3 දක්වා කාලයක් ගතවී තිබුණ ද, වාහනවල අලුත්වැඩියාව අවසන්කර ධාවනය සඳහා යොදාගෙන නොතිබුණි.	අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් ආනයනය කළ යුතු බව, පිටත ආයතනයකින් අලුත්වැඩියාව සිදුකිරීමට, ප්‍රසම්පාදන ක්‍රමවේදය ක්‍රියාත්මකකර අලුත්වැඩියා අමතර කොටස් මිලදීගැනීමේ සැපයුම් කරුවන් අමතර කොටස් සැපයීය නොහැකි බවත් දන්වා සිටීම යන හේතු නිසා මෙම අලුත්වැඩියාවන් සිදුනොකර ඇත.	වාහන අලුත්වැඩියා ඉක්මනින් අවසන් කර ධාවනය සඳහා යොදවා ගත යුතු බව.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වන අතර, මුදල් රෙගුලාසි 881	ඇප තැන්පත්කර නොමැති සියලුම මාණ්ඩලික/විධායක නිලධාරින්ගෙන් හා ගබඩා භාරකරු, සරප් නිලධාරි හා සියලුම රියදුරන්ගෙන් ඇපමුදල් තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භකර ඇත.	මු.රෙ. 880 හා 881 ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වන

	ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරියෙකු එකී තනතුරට පත්කළ දිනයේ සිට හෝ එවැනි තනතුරකට මාරුකළ දිනයේ සිට දෙමසක් ඇතුළත ඇප තැබීම කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ නිලධාරීන් 19දෙනෙකුගෙන් ඇපමුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.		නිලධාරීන්ගෙන් ඇප තබා ගත යුතු වීම.

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට මු.රෙ. 109 ප්‍රකාරව කටයුතු නොකරන ලද රු.45,136,076ක වටිනාකමක් සහිත කපානොහළ හානිවීම් පැවති අතර, ඒ තුළ වර්ෂ 10 ඉක්ම වූ වාහන අනතුරු 03කට අදාළ කපානොහළ රු.1,768,477ක ශේෂයක් ද, වර්ෂ 05ත් 10ත් අතර, වාහන අනතුරු 5කට අදාළ රු.4,180,534ක ශේෂයක් හා වර්ෂ 02 හා 05 අතර වාහන අනතුරු 17කට අදාළ රු.11,053,645ක ශේෂයක් ද පැවතුණි.	මු.රෙ. 109 ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බව.	මු.රෙ. 109 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(ආ)	පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි වර්ෂය තුළ පොතෙන් කපාහැරීම් ලෙස වාහන අනතුරු ඇතුළු වෙනත් හානිවීම් 20කට අදාළ රු.21,252,831ක මුදලක් කපාහැරීම් ලෙස දක්වා තිබුණ ද, ඉන් රු.9,327,740ක් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි	මු.රෙ. 109 යටතේ රජයෙන් කපාහැරීම සඳහා අනුමැතිය ලද පොදු 285 පෝරමවල පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කරමි.	පොත්වලින් කපාහැරීමේදී විධිමත් අනුමැතියකින් කපාහැරීම සිදුකළ යුතු බව.

4.6 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ විදුලි බිල්පත්වලට	පුද්ගල අනන්‍යතා ගොඩනැගිල්ලේ ස්ථාපිතකර ඇති රාජ්‍ය ආයතන නියමිත දිනට පෙර අදාළ බිල්පත්	මාසික විදුලි බිල් නියමිත දිනට ගෙවීම සිදුකළ යුතු ය.

නියමිත කාලයේ දී මුදල් නොගෙවීම නිසා හිඟ විදුලි බිල්පත්වලට අදාළව අධිභාර වශයෙන් රු.218,786ක මුදලක් ගෙවා තිබුණි.	නොපියවීම මත හිඟ විදුලි බිල්පත් වලට අදාළව අධිභාර ගණනය වී ඇති අතර, නියමිත දිනට පෙර බිල්පත් ගෙවීම් කරන ලෙස ගොඩනැගිල්ලේ ස්ථාපිතකර ඇති ආයතන දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත.	

4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නිලධාරීන් මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැරයාම සහ අනෙකුත් හේතු මත දැනට අමාත්‍යාංශයේ සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයකට වඩා වැඩි ණයශේෂ එකතුව රු.711,648ක් වූ අතර, එහි වර්ෂ 10 ඉක්මවූ වැඩ තහනමට ලක්වූ සේවකයෙකුගෙන් අයවිය යුතු රු.218,187ක හිඟ ණයශේෂයක් ද වර්ෂ 05 ඉක්මවූ සේවය හැරගිය සේවකයකුගෙන් අයවිය යුතු රු.40,085ක ණයශේෂයක් ද පැවතුණි.	ඇතැම් නිලධාරින්ගෙන් අයවීම් කරගනු ලබන අතර, ඇතැම් නිලධාරින් විශ්‍රාම පාරිතෝෂිතයෙන් හා විශ්‍රාම වැටුපෙන් අයකිරීම සඳහා තොරතුරු ලබා දී ඇත. එසේ නොමැති නිලධාරින්ට සිහිකැඳවීම් ලිපි යවා ඇත.	හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලකට අනුව සිදුකළ යුතු වීම.
(ආ)	පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ එක් එක් ආයතන භාවිතා කරන ලද විදුලි ඒකක ගණන අනුව ගෙවිය යුතු විදුලි ගාස්තු නිරවුල්කර නොමැති අවස්ථා නිරීක්‍ෂණය වූ අතර, අමාත්‍යාංශය විසින් එක් එක් ආයතනවලින් ලැබිය යුතු විදුලි ගාස්තුවලට අදාළව ගණනය කරන ලද වාර්තා අනුව 2024 දෙසැම්බර් 31 දිනට මාස 01 සිට මාස 18 දක්වා කාලයකට අදාළව රු.12,613,858ක විදුලි ගාස්තුවක් නිරවුල් කිරීමට ඇත.	හිඟ විදුලි බිල්පත් අදාළ පොළී මුදල් ද සහිතව පියවීමට කටයුතු කරන ලෙසට එහි සඳහන් සියලුම ආයතන දැනුවත්කර ඇත. ඒ අනුව සමහර ආයතන මේ වන විට හිඟ විදුලි බිල්පත් අදාළ පොළී මුදල් ද සහිතව සම්පූර්ණයෙන්ම පියවීම්කර ඇති අතර, අනෙකුත් ආයතන අදාළ පියවීම් සඳහා මේ වන විට ආයතනික මට්ටමෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා ඇත.	විදුලි බිල්පත්වලට අදාළ ගාස්තු නියමිත පරිදි ආයතනවලින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව.

(ඇ) **රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය**

(i)	1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9(ඇ) වගන්තිය ප්‍රකාරව සෑම අවුරුද්දකටම යටත් පිරිසෙන් එක්වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධානයේ ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු වුව ද, දැනට ලියාපදිංචිකර ඇති ස්වෙච්ඡා සංවිධාන බොහෝ ප්‍රමාණයක ගිණුම් විගණනය සිදුනොවන අතර, 2023 වර්ෂයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින රාජ්‍ය නොවන සංවිධාන 625න් විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත්කර ඇත්තේ සංවිධාන 90ක් පමණි. තව ද, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට වාර්ෂිකව ලබාදිය යුතු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා හා වත්කම් වාර්තා යාවත්කාලීනව ලබාදීම ඉතා අඩුමට්ටමක පැවතුණි.	අදාළ කාලපරිච්ඡේදය වන විට ලැබී තිබූ විගණන වාර්තා ගණන 90කි. නමුත් මේ වන විට විගණන වාර්තා 123ක් අප කාර්යාලය වෙත ලැබී ඇති අතර, විගණන වාර්තා ගෙන්වා ගැනීම සඳහා අප විසින් විද්‍යුත් තැපැල් හා ලිපි අදාළ සංවිධානවලට යොමුකර ඇත. මීට අමතරව සංවිධාන 625 සඳහාම දුරකථන ඇමතුම් ද ලබා දී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස තවදුරටත් කාර්යාලය වෙත විගණන වාර්තා ලැබෙමින් පවතී. එමෙන්ම, අලුතෙන් ලියාපදිංචි වී ඇති සංවිධාන ද විගණන කාලපරිච්ඡේදය අවසන් වූ පසු විගණන වාර්තා එවන බවට දැනුම් දී ඇත. අඛණ්ඩව වර්ෂ 03ක් ඇතුළත විගණන වාර්තාව ඇතුළු අනෙකුත් වාර්තා නොඑවන ලද සංවිධාන වෙත ලිපි මගින් දැනුවත්කර එම ලිපිවලට ප්‍රතිචාර නොදැක්වූයේ නම් අක්‍රීය සංවිධානයක් ලෙස නම් කර වෙබ්අඩවියේ ද පළකිරීමට කටයුතු කරනු ලැබේ.	ක්‍රියාකාරී මට්ටමේ පවතින රාජ්‍ය නොවන සංවිධානවලින් විගණනය කරන ලද මූල්‍ය වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු අතර, වාර්ෂිකව ලබාදිය යුතු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා හා වත්කම් වාර්තා යාවත්කාලීනව ලබාගැනීමට කටයුතු කළ යුතුවීම.
(ii)	2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලියාපදිංචි වී ඇති රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ලැබී ඇති පැමිණිලිවලින් දැනට නොවිසඳී ඇති පැමිණිලි 12කි.	2024 වර්ෂයේ ලැබී ඇති දැනට නොවිසඳී ඇති පැමිණිලි 12ට අදාළව මූලික කටයුතු සිදුකර ඇති බැවින්, අදාළ පාර්ශවවලින් විගණන වාර්තා ලබාදිය යුතු බවට දැනුවත්කර ඇත.	ලැබී ඇති පැමිණිලි විසඳීමට කටයුතු කළ යුතු බව.

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මහජන ආරක්ෂක අමාත්‍යාංශය		
අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 16ක් පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශ කටයුතු පවත්වාගෙන යෑමට බාධාවක් වී තිබුණු අතර, උක්ත පුරප්පාඩු තුළ අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ඉ.සේ), අධ්‍යක්ෂ (සැලසුම/ශ්‍රී.ලං.ප.සේ) හා අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ) යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු අන්තර්ගත විය. තව ද, පරිපාලන නිලධාරී, දෙමළ භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරී හා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 60ක්, පුරප්පාඩුව පැවතුණි.	අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින තනතුරු පිළිබඳව දන්වමින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇති අතර, එම පුරප්පාඩු තනතුරු මේ වන තෙක් සම්පූර්ණ කර නොමැත.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවරගත යුතු බව.
(ආ) විශේෂ කාර්යය බලකාය		
(i) නියෝජ්‍ය පොලිස්පති තනතුරු 02ක්, කාන්තා පොලිස් පරීක්ෂක තනතුරු 07ක්, මහසැරයන් තනතුරු 37ක් සහ මහසැරයන් රියදුරු තනතුරු 08ක් ලෙස අනුමත තනතුරු සංඛ්‍යාව වූ 54ක ප්‍රමාණයම සියයට 100ක්ම පුරප්පාඩු වී පැවතුණි.	විශේෂ කාර්යය බලකායට අනුමතව ඇති නියෝජ්‍ය පොලිස්පති තනතුරු දෙක සඳහා උසස්වීම් ලබාදීමට සුදුසුකම් සපුරා ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මහතුන් මේ වන විට විශේෂ කාර්යය බලකායට අනුයුක්තව සිටින අතර, නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස්වීම් ලබාදීම සඳහා පරීක්ෂණ මණ්ඩල පැවැත්වීමට මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. කාන්තා පොලිස් පරීක්ෂක, මහසැරයන් හා මහසැරයන් රියදුරු තනතුරුවල පවතින පුරප්පාඩු බඳවාගැනීම් හා උසස්කිරීම් පරිපාටිය අනුව සම්පූර්ණ කිරීමට මෙතෙක් අනුමැතිය ලැබී නොමැති අතර, එම පුරප්පාඩු ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධරයන්ට උසස්වීම් ලබාදීමට කටයුතු කරන පළමු අවස්ථාවේදීම සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු බව.

(ii)	සහකාර පොලිස් අධිකාරී තනතුරේ 44ක් වූ, අනුමත තනතුරු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 24ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 55ක් විය.	සහකාර පොලිස් අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උසස්වීම් පරීක්ෂණ මණ්ඩලයක් පැවැත්වීමට මෙතෙක් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොමැත.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවරගත යුතු බව.
(iii)	උපපොලිස් පරීක්ෂක තනතුරේ අනුමත සංඛ්‍යාව 812ක් වුව ද, පුරප්පාඩු 266ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 33ක් විය.	උපපොලිස් පරීක්ෂක තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උසස්වීම් පරීක්ෂණ මණ්ඩලයක් පැවැත්වීමට අනුමැතිය ලැබී නොමැත.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවරගත යුතු බව.
(iv)	පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 6,999ක් වුව ද, පුරප්පාඩු 2,814ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 40ක් විය.	සෘජු බඳවාගැනීම් මගින් සම්පූර්ණ කළ යුතු ආධුනික පොලිස් කොස්තාපල් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ඉල්ලා පොලිස්පතිතුමා වෙත ලිපි ඉදිරිපත්කර ඇත. නව බඳවාගැනීම් සිදුකිරීමට මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. එසේම ආධුනික පොලිස් කොස්තාපල් තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකා පොලීසිය වෙත බඳවාගැනීමට අනුමැතිය ලබා දී ඇති ආධුනික පොලිස් කොස්තාපල්වරුන් 1,770න් ආධුනික පොලිස් කොස්තාපල්වරුන් 250දෙනෙකු බඳවාගැනීම සඳහා පොලිස්පතිතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවරගත යුතු බව.
(ඇ)	**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය**		
	ආයතනය සඳහා වූ 77ක අනුමත කාර්යමණ්ඩලයෙන්, 19දෙනෙකු එනම් සියයට 27ක් පුරප්පාඩු පැවති අතර, ඒ තුළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර, සහකාර අධ්‍යක්ෂ තනතුරු 03ක්, ගණකාධිකාරී, සංවර්ධන නිලධාරී/සංවර්ධන සහකාර තනතුරු 11ක් සහ රියදුරු තනතුරු 03ක් ද අන්තර්ගත විය.	මෙම තනතුර පුරප්පාඩු වී ඇති නිසා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ කටයුතු නැවතී ඇති බැවින් මෙම තනතුරු 19 කඩිනමින් පිරවිය යුතු ය.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවරගත යුතු බව.

(ඇ)	2001 අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවයකර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, අමාත්‍යාංශය තුළ වර්ෂ 05ක සිට වර්ෂ 11කට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 18දෙනෙකු සඳහා ස්ථාන මාරු ලබාදීමට කටයුතුකර නොතිබුණි.	උක්ත නිලධාරීන් මීට පෙර වර්ෂවල දී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම්කර තිබූ අතර, එම නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරු ලැබී නොතිබුණි. එසේම ඒ සෑම වර්ෂයක දී ම අවුරුදු 06ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ ලැයිස්තුවක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. නමුත්, එම නිලධාරීන් හට මේ වන තුරු ස්ථාන මාරු ලැබී නොමැත.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ඉ)	ආයතන සංග්‍රහයේ VII (12:2:3) වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමට පත්කරනු ලබන තනතුර පූර්ණ කාලීන වූ ද, ළඟදීම පූර්ණකාලීන නිලධාරියෙකු පත්කිරීමට අදහස්කර ඇත්තා වූ ද, තනතුරක් විය යුතු වුව ද, පරිපාලන නිලධාරී තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු පත්නොකර වර්ෂ 11කට වැඩි කාලයක් වැඩබැලීමේ රාජකාරී ඉටුකිරීම සඳහා එක් නිලධාරියෙකු පත්කර තිබුණි.	මෙම අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරි තනතුරේ රාජකාරී කළ නිලධාරිනිය (රා.කළ.ස. අධිශ්‍රේණිය) 2019.03.15 දින ස්ථාන මාරුවීම හේතුවෙන් 2019.03.16 දින සිට එම තනතුර පුරප්පාඩු විය. ඉන්පසු එම තනතුරෙහි වැඩබැලීම සඳහා මෙම අමාත්‍යාංශයේ කළ.සේ.නි. I තනතුරෙහි සේවය කරන ඩී.එම්.එන්. දිසානායක මහතාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව 2020.07.01 දින සිට මේ දක්වා නිත්‍ය තනතුරට අමතරව වැඩ බැලීම සඳහා පත්කර ඇත. එසේම රාජ්‍ය පරිපාලන ලේකම්ගේ 2025.03.24 දිනැති ලිපියෙන් උක්ත තනතුර සඳහා නිලධාරිනියක් පත්කර එවා ඇති අතර, මේ වන තුරු එම නිලධාරිනිය මෙම අමාත්‍යාංශයේ සේවයට වාර්තාකර නොමැත.	ආයතන සංග්‍රහයේ vii(12.2.3) පරිදි නිලධාරින් පත්කිරීම කළ යුතු බව.